// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1824/23 - 2013 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2013.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2013 අංක 12 දරන මුදල් පනත**

15 වගන්තිය යටතේ නියමය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමග කියවිය යුතු 2013 අංක 12 දරන මුදල් පනතේ 15 වන වගන්තියේ (1) වන උප වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින්,

(අ) මෙහි නිශ්චිතව සඳහන් කර ඇති පහත පනත යටතට ගැනෙන සෑම ආයතනයකින්ම, එවැනි ආයතනවල බදු අය කිරීමෙන් පසු ලාභයෙන් සියයට එකක බෝග රක්ෂණ බද්දක්, 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත යටතේ ස්ථාපිත ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය වෙත මෙහි උපලේඛන I හි නිශ්චිතව සඳහන් පරිදි ගෙවිය යුතු බවට ප්‍රකාශයට පත් කරමි.

I. 1988 අංක 30 දරන බැංකු පනත ;
II. 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත ; හෝ
III. 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත.

(ආ) මෙම නියෝගය 2013.04.01 දින සිට බල පැවැත්වේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2013 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ දී ය.

1A - PG 001731 — 1650 (2013/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය I

(1) එම බදු මුදල යම් තක්සේරු වර්ෂයක (යම් වර්ෂයක අප්‍රේල් මස පළමු වන දිනයෙන් ආරම්භ වී, ඉක්බිතිවම එළැඹෙන වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනෙන් අවසන් වන මාස දොළහක කාල පරිච්ඡේදය) එක් එක් කාර්තුවේ (අදාල වර්ෂයේ අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් සහ ඉක්බිතිව එළැඹෙන වර්ෂයේ ජනවාරි යන මාසවලින් ඇරඹෙන මාස තුනක කාල පරිච්ඡේදය) ඇස්තමේන්තු කළ බදු පසු ලාභය පදනම් කරගෙන ගණනය කළයුතු අතර, අදාල තක්සේරු වර්ෂය අවසානයේ දී සැසඳුම් කර, අතිරේක බද්දක් ගෙවිය යුතුව ඇත්නම් අදාළ තක්සේරු වර්ෂයට ඉක්බිතිව එළඹෙන තක්සේරු වර්ෂයේ සැප්තැම්බර් මස තිස්වන (30) දින හෝ එදිනට පෙර ගෙවිය යුතු අතර, යම් අතිරික්තයක් වේ නම්, ඉදිරි තක්සේරු වර්ෂයේ දී ගෙවිය යුතු බද්දට හිලව් කළ හැක.

(2) බද්දට යටත්වන සෑම ආයතනයක් විසින්ම, අදාල බද්ද මෙම කාර්යය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය විසින් ආරම්භ කර ඇති ගිණුමට, එක් එක් කාර්තුවක් අවසන් වී දින 30ක් ඇතුලත ගෙවිය යුතු ය. නිශ්චිත දිනවල දී බද්ද නොගෙවා තිබේ නම්, අදාල බද්දට අතිරේකව ගෙවීම් හිඟ වූ මුල් දින 30 සඳහා සියයට දහයකට සමාන දඩ මුදලක් සහ ඉන්පසු හිඟ වන සෑම දින 30ක් හෝ ඉන් කොටසක් සඳහා තවත් සියයට දෙක බැගින් වූ අතිරේක දඩයක් (බද්දෙන් සියයට පනහක් නොඉක්මවන) ගෙවිය යුතු වේ.

එසේ වුවත්, එම තක්සේරු වර්ෂයට පෙරාතුව වූ තක්සේරු වර්ෂයේ සම්පූර්න බද්දට පසු ලාභය මත ගණනය කරනු ලැබූ අදාල බද්දෙන් 1/4 කට අඩු නොවන බද්දක්, අදාල බදු ගෙවිය යුතු දිනවල ගෙවා, ගෙවිය යුතු ඉතිරියක් වෙතොත්, එම තක්සේරු වර්ෂයට පසුව එළඹෙන තක්සේරු වර්ෂයේ සැප්තැම්බර් මස තිස්වන (30) දින හෝ එම දිනට පෙර ගෙවා තිබේ නම් ඉහත දඩය අය නොකරනු ඇත.

එසේම තවදුරටත්, 2013 ජූනි 30 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා 2013 ජූලි මස 31 වන දින හෝ එදිනට පෙර ගෙවිය යුතුව තිබූ බද්ද, 2013 සැප්තැම්බර් මස 30 වන දිනෙන් අවසන් වන කාර්තුවට ගෙවිය යුතු බද්ද සමග 2013 ඔක්තෝබර් මස 31 දින හෝ එදිනට පෙර ගෙවන්නේ නම් එම බද්ද සඳහා දඩය අය නොකරනු ඇත.

09 - 118

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.